**මහනුවර මහා නගර සභාවේ නීති අංශය සඳහා ශ්‍රම මිලදීගැනීමේ පදනම මත නීති සේවය ලබා ගැනීම**

මහනුවර මහා නගර සභාවේ සේවා අවශ්‍යතාවය මත ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත නීති නිලධාරි කාර්යයන් ඉටුකර ගැනීමේ සේවය ලබා ගැනීමට නියමිත සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහල කෙළවරෙහි සේවාවේ නාමය සඳහන් කර 2025.04.21 දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, මහනුවර මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

1. මිලදි ගැනීමට නියමිත සේවාව : මහනුවර මහා නගර සභාවේ නීතිමය කාර්යයන් ඉටුකර ගැනීම සඳහා ශ්‍රම මිලදීගැනීමේ පදනම මත සේවය සපයා ගැනීම

2. මාසික දීමනාව : මාසික දීමනාව රු 97915/- කි (මසකට දින 21 ක් රාජකාරී ඉටු කිරීම සඳහා)

3. කායික සුදුසුකම් : අදාල සේවාව ලබා දිමට ප්‍රමාණවත් තරම් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

4. අධ්‍යාපන සුදුසුකම් : ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ නීති විද්‍යාලයේ නීතිය පිළිබඳ උපාධිය ලබා තිබීම

5. වෘත්තීය සුදුසුකම් : ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර තුනකට (03) නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් තිබීම

හෝ

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය ආයතනයක නීති ක්ෂේත්‍රයේ වසර තුනකට නොඅඩු පහත දැක්වෙන කාර්යයන්වලට අදාල පළපුරුද්ද ලබාතිබීම

I. නඩු සම්බන්ධයෙන් නීති කටයුතු හා නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරිම

II. ගිවිසුම හා සම්බන්ධ නෛතික කටයුතු

III. අදාල අණ පනත් සම්බන්ධව නෛතික කටයුතු

IV. පනත් කෙටුම්පත්, චක්‍රලේඛ, රෙගුලාසි වැනි නීත්‍යානුකූල ලියවිලි සම්පාදන කටයුතු

V. විවිධ ව්‍යවස්ථාපිත ආයතනවලින් පවත්වනු ලබන නීති හෝ අධිකරණ කටයුතු හෝ පරීක්ෂණ කටයුතු

6. වෙනත් සුදුසුකම් : (i) අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(ii) බඳවා ගැනීම සඳහා වන සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7. වයස : සියළුම අයදුම්කරුවන් අයදුම්පත් ඉදිරිපත් කරන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

8. තෝරා ගැනීමේ ක්‍රමය : සුදුසුකම්ලත් නිලධාරින් පහත කොන්දේසීවලට යටත්ව සේවයට තෝරා ගනු ලැබේ.

- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් ලබා ගන්නා ලද ලකුණුවල ප්‍රමුඛතාවය අනුව සේවයේ යොදවා ගැනීමට අපේක්ෂිත තනතුරු සංඛ්‍යාව 01කි.
- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරු සේවා සපයා ගැනීම සඳහා යොදවා ගනු ලැබේ.

9. සේවා කොන්දේසි :

- සේවය සපයා ගැනීමේ කාලය බඳවාගැනීමේ දින සිට මාස 06කි. සේවා අවශ්‍යතාවය මත කාලය දීර්ඝ කිරීම නාගරික කොමසාරිස් විසින් තීරණය කරනු ඇත.
- අවශ්‍ය ඕනෑම අවස්ථාවක සේවය අවසන් කිරීමේ බලය නාගරික කොමසාරිස් සතු වේ.
- තෝරාගත් අයවලුන් යම් අවස්ථාවක සේවයෙන් ඉවත්වේ නම් මාසයකට පෙර දැනුම් දීමක් සිදුකළ යුතුය.
- මෙම සේවයේ යොදවා ගැනීම හුදෙක් සේවා අවශ්‍යතාවය මත පමණක් වන බැවින් රජයේ කිසිදු තනතුරක් දැරීම සඳහා එය අයිතිවාසිකමක් නොවේ.
- තෝරාගන්නා අයදුම්කරු මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සමඟ සේවා ගිවිසුමකට ඇතුළත් විය යුතුය.

සටහන :- මෙම සේවා සපයා ගැනීම සඳහා වන අයදුම්පත් මහනුවර මහා නගර සභාවේ www.kandy.mc.gov.lk වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සියළු සුදුසුකම් සපුරා තිබිය යුතු අතර සේවය ලබා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුවේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවාගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

2025.03.28

ඒ.එච්.එම්. ඉන්දිකා කුමාරී අබේසිංහ
නාගරික කොමසාරිස්
මහනුවර මහා නගර සභාව